# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823

වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. BD/CBP/1/1/2010 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2009 .12. 11 |

අයවැය චක්‍රලේඛ අංක : 145

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**වියදම් දැරීම සඳහා බලය දීම - අතුරු සම්මත ගිණුම 2010**

2010 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත අනුමත වන තෙක් දැනට පවත්නා සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම පිණිස පාර්ලිමේන්තුව විසින් අතුරු සම්මත ගිණුම පිළිබඳ යෝජනාව අනුමත කර තිබේ. මෙම අතුරු සම්මත ගිණුම යටතේ වියදම් දැරීම සඳහා අදාල බලපත්‍රවලට ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත. ඒ අනුව, ගෙවීම් වවුචර්වල සහ අනෙකුත් ලියකියවිලිවල සඳහන් කළ යුතු බලයන් පහත සඳහන් පරිදි වේ.

i. අතුරු සම්මත ගිණුම (පොදු සේවා සඳහා) - 2010 අංක 1 දරණ බලපත්‍රය (අතුරු සම්මත ගිණුම)
ii. අතුරු සම්මත ගිණුම (අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ) - 2010 අංක 1 දරණ අත්තිකාරම් බලපත්‍රය
iii. විශේෂ නීති සේවා කටයුතු සඳහා 2010 අංක 1 දරණ විශේෂ නීති සේවා අධිකාරී බලපත්‍රය

02. අතුරු සම්මත ගිණුමෙන් වියදම් දැරීමට අවසර ලැබෙනුයේ 2009 වර්ෂයේ ඇස්තමේන්තුවල ඇතුලත්, භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද වැඩසටහන්, ව්‍යාපෘති සහ වැය විෂයයන් සඳහා පමණකි. එබැවින් අළුතින් වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධ වියදම් දැරීමට 2010 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත සම්මත වනතුරු සිටිය යුතු බව මින් අදහස් කෙරේ.

03. ඒ ඒ වියදම් ශීර්ෂවල එක් එක් වැඩසටහන යටතේ වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය මේ සමඟ ඇති පළමුවන උපලේඛණයෙහි දක්වා ඇත. *"2010 වසර සඳහා අතුරු සම්මත ගිණුම - විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු සැකසීම"* මැයෙන් වූ මාගේ 2009.11.24 දිනැති ලිපියේ මාර්ගෝපදේශ අනුව ඔබ විසින් සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට එවන ලද විස්තරද සලකා බැලීමෙන් පසු එක් එක් වියදම් ආයතනවල 2010 මුල් මාස හතර සඳහා වැඩසටහන්, ව්‍යාපෘති සහ වැය විෂයය සංකේතාංක යටතේ දැරිය හැකි උපරිම වියදම් සීමා ඇතුලත් අයවැය ඇස්තමේන්තුවක් වෙනමම එවීමට ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ. කෙසේ වුවද ඒ ඒ වැඩසටහන යටතේ දැනටමත් පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති අතුරු සම්මත ගිණුමේ සීමාවන් නොඉක්මවීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

04. මේ සමඟ ඇති දෙවැනි උපලේඛණයෙහි අත්තිකාරම් ගිණුම්වල උපරිම හා සීමාවන් දැක්වෙන අතර, එම සීමාවන් නොඉක්මවා උපලේඛණයෙහි සඳහන් පරිදි අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධව වියදම් දැරීමට ගණන්දීමේ නිලධාරීන්ට හැකිවේ.

05. දැනටමත් පාර්ලිමේන්තු සම්මතය ලැබී ඇති විශේෂ නීති සේවා කටයුතු සම්බන්ධයෙන් 2010 වර්ෂය තුළ අවශ්‍ය වන සම්පූර්ණ මුදල් ප්‍රමාණය වෙනුවෙන් ගරු මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් බලපත්‍රයක් නිකුත් කොට ඇත.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්